// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2282/21 - 2022 මැයි මස 31 වැනි අඟහරුවාදා - 2022.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 මැයි මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි "**2022 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. 2022 මාර්තු මස 09 දිනැති අංක 2270/18 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සහ 2022 අප්‍රේල් මස 09 දිනැති අංක 2274/42 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, ඒවා බලාත්මකව පවතින කාලය තුළ ඒ යටතේ සිදු කරන ලද කිසිදු ක්‍රියාවක වලංගුභාවයට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

3. ඉහත රෙගුලාසි අංක 2හි සඳහන් පරිදි 2022 අංක 05 හෝ 2022 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් 2022 මාර්තු මස 10 සිට 2022 මැයි මස 31 දක්වා කාලය තුළ නියාමනය කරන ලද ඕනෑම භාණ්ඩයක්/භාණ්ඩ තොගයක්, 2022 ජූනි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, ආනයන පාලන බලපත්‍රයක් නොමැතිව රේගු ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව මුදා හැරීමට ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට මෙයින් බලය පවරනු ලැබේ.

4. මෙම රෙගුලාසි 2022 ජූනි මස 01 වැනි දින සිට බලාත්මක වේ.

EOG 06 - 0036

1A - PG 5857 - 456 (2022/06)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*